# නීති පද්ධතියේ පවතින විභවතාවයන් හමුවේ පෙරට ආ දේව විශ්වාස පිළිබඳ අධ්‍යයනයක්

එච්.ජේ.එස්.එම්. ජයලත්[1]

ලෝකයේ සෑම රටකම පාහේ සම්මත නීති ඇත්තේ පොදු ජනයා තුළ සාමය හා ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම පිණිසය. නූතන මිනිසා කාර්මික වශයෙන් දියුණු වෙත් ම මිනිසුන් අතර ඇතිවන ගැටලු සංසිඳවීමටත්, යුක්තිය පසඳලීමටත් වත්මන් අධිකරණය බැඳී සිටී. නමුත් ලාංකේය ජනතාව තුළ අතීතයේ පටන්ම සාම්ප්‍රදායික දේව විශ්වාස සහ අධිමානුෂීය බලවේග කෙරෙහි පවත්නා විශ්වාසය අසීමිතය. මිනිසුන් අතරින් සමහරෙක් අදෘශ්‍යමාන බලවේග කෙරෙහි විශ්වාසය තබා ඇත්තේ නූතනයේ ක්‍රියාත්මක වන නීතියෙහි හිඩැස් පැවතීම හෝ ඔවුන් තුළ විශ්වාසයක් නොමැති වීම වන්නට පිළිවන. මෙහි දී සීනිගම දෙවොල් දේවාලයේ ක්‍රියාත්මක වන දේව විශ්වාස මොනවා'ද සහ නීතියේ පවතින විභවතාවයන් මොනවා'ද යන්න හඳුනාගැනීම ප්‍රධාන අරමුණ වන අතර යුක්තිය පසඳලීමට පිළිගත් දියුණු ක්‍රමවේදයන් පැවතිය ද මිනිසා අදෘශ්‍යමාන බලවේග කෙරෙහි විශ්වාසය තබා ඇත්තේ මන්ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුව වේ. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණ හා පුස්තකාල අධ්‍යයනයක් සිදුකරන ලදි. නූතනයේ සම්මත පොදු නීති පද්ධතියක් ක්‍රියාත්මක වුව ද නෛතික රාමුවෙන් පිට ක්‍රියාත්මක වන දේව විශ්වාස හා අභිචාර විධි සඳහා මිනිසුන් මෙතරම් රුචිකත්වයක් දක්වන්නේ තම අසාධාරණත්වයේ විනිශ්චය දෙවියන්ට හෝ අදෘශ්‍යමාන බලවේගයකට භාරකරනුයේ නීතියෙන් හෝ අන් කිසිවෙකුගෙන් පිළිසරණක් නොලැබෙන විටකය. වත්මනේ සීනිගම දෙවොල් දේවාලයේ පොල් ගැසීම, මිරිස් ඇඹරීම, අවලාද පූජා පැවැත්වීම සිදුකරනුයේ උගත්-නූගත්, ගිහි-පැවිදි, දෙස්-විදෙස් භේදයකින් තොරව දේවාල පරිශ්‍රයට පැමිණෙන බැතිමතුන්ගේ එකම ගැලවුම්කරුවා දෙවොල් දෙවියන් යැයි විශ්වාසය තබන බැවිනි. ඒ අතර ඉඩම් ආරවුල්, අනියම් සබඳතා, සොරකම් ආදී සාහසිකකම්වලට පලිගසන අවලාද කරන්නෝ දැකගත හැකිය. එතුළ ඇතැමෙක් වැරදිකරුවන්ට නීතියෙන් දෙන ලද දණ්ඩනයෙන් අතෘප්ති වී ඔවුන්ට දැඩි දඬුවම් දීමට අදෘශ්‍යමාන බලවේග කෙරෙහි පෙළඹෙති. එමෙන්ම අධිකරණයෙන් සාවද්‍ය සාක්ෂි මත පදනම්ව ඇතැම් තීරණ වෙනස් කළ හැකි වුවත් දෙවියන් ඉදිරියේ මූලික වන්නේ හෘද සාක්ෂියයි. එහිදී සාමාන්‍ය පොදු නීතියෙන් ලැබෙන දඬුවම්වලට වඩා දේව සභාවෙන් ලබාදෙන දඬුවමට හුදෙක් මනුෂ්‍යයන් බියක් දක්වන්නේ නීතියේ බලය ඉක්මවා ගිය බලයක් දෙවියන් තුළ පවතින බව විශ්වාස කරන බැවිනි. ලන්දේසි නීති පද්ධතියේ ආභාෂිත නීති ක්‍රම කල්පැන යාම, නීතියේ ආධිපත්‍ය ගිලිහී යාම, දේශපාලනික අතපෙවීම් නූතන නීති පද්ධතියේ ස්වෛරීත්වය හා ස්වාධීනත්වය බෙලහීන කොට තිබීම මෙන් ම ගතානුගතික සංස්කෘතිය වෙනස් කිරීමට ඇති අකමැත්ත, දේව විශ්වාස පිළිබඳ සමාජ මතය හා දූෂ්‍ය ආකල්ප නෛතික රාමුවෙන් පිට දේව විශ්වාස කෙරෙහි මිනිසා පෙළඹීමට උත්සුක වී ඇත.

ප්‍රමුඛ පද : නීති පද්ධතිය, විභවතාවයන්, දේව විශ්වාස, සාම්ප්‍රදායික, අදෘශ්‍යමාන බලවේග

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. maheshijayalath95@gmail.com